කොවිඩ්-19 ගෝලීය ව්‍යාප්ත වසංගත තත්වය හා සටන් වදිමින් සිටිනා මොහොතකදී, ජනමාධ්‍යයන් හට ආචාර ධාර්මික හැසිරීමක් පවත්වා ගැනීම ඔස්සේ ඊට දායක වීමට හැකියාව තිබේ. විශේෂයෙන්ම සෑමවිටම කොවිඩ්-19 පිළිබඳව වාර්තා කිරීම සඳහා සත්‍ය සහ තහවුරු කරන ලද මූලාශ්‍ර පමණක් භාවිතා කරන මෙන්, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය වෙනුවෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කළ නිර්දේශයන්හි දක්වා තිබේ.

පුවත්පත් වාර්තාවන්හි අඩංගු පහත ආකාරයේ කරුණු ප්‍රශ්න කිරීමකට ලක්වන්නේ එම පසුබිම්මේදීයි. අරුණ පුවත්පතේ වෛද්‍යවරයෙකු විසින් සම්පාදිත ලිපියක් ලෙසින් පළවූ මෙහි අඩංගු කරුණක් වන්නේ, [සාර්ස්-කොව්-2] වෛරසයට පැය 8 ක් දක්වා වාතයේ නොනැසී රැඳීමට හැකි බව ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගෙන ඇති බවයි. එනමුත් ගැටළුව වන්නේ මෙසේ පවසා ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් නිකුත් කොට ඇති කිසිදු වාර්තාවක් සොයාගැනීමට නොමැති වීමයි. එසේම මෙය මදක් ව්‍යාකූල ප්‍රකාශයක්ද වේ. කහින විට, කිවිසින විට හෝ කථා කරන විට විසිවන වෛරසය රැඳුණු බිඳිති වඩාත් බරැති බැවින් ඊට වාතයේ රැඳී නොතිබෙන බවත්, ඒවා පොළව මතට හෝ පෘෂ්ටයක් මතට වැටෙන බවත් ලෝක සෞඛ්‍ය සංවිධානය ස්තීරවම ප්‍රකාශ කරයි. අනෙක් අතට පෘෂ්ටයන් මත වෛරසයට පැවතීමට හැකි කාලය පැය කිහිපයක සිට දින කිහිපයක් දක්වා වෙනස් විය හැකි බවත්, එය විවිධ කරුණු මත වෙනස් විය හැකි යැයි අධ්‍යයනයන් මගින් යෝජනා කෙරෙන බව ඔවුන් පවසයි. යම් යම් වෛද්‍ය ප්‍රතිකාර සම්බන්ධ ක්‍රියාකාරකම් වැනි වාතය තුළ රැඳෙන ඉතා කුඩා අංශු (එරෝසෝල) ජනනය කෙරෙනා විශේෂ අවස්ථාවක හැරෙන්නට, සාර්ස්-කොව්-2 වෛරසය වාතය ඔස්සේ බෝවීමේ හැකියාවක් නැති බවද ඔවුන් පවසයි.

කරුණු එසේ නම්, පුවත්පත වාර්තා කොට ඇත්තේ වෛද්‍යවරයා දැක්වූ කරුණු ඒ ආකාරයෙන්මද? එසේ නම්, මෙම තොරතුර නිවැරදි යැයි ලිපිය සම්පාදනය කළ අදාළ වෛද්‍යවරයා සහ පුවත්පත විසින් සනාථ කොටගත්තේ කෙසේද? ඒ සඳහා තහවුරු කරන ලද මූලාශ්‍ර භාවිතා කොට තිබේද? පාඨකයින් ලෙසට අප නැගිය යුතු පැනයන් මේවායි.

මූලාශ්‍ර:
https://www.who.int/news-room/q-a-detail/q-a-coronaviruses
https://www.who.int/news-room/commentaries/detail/modes-of-transmission-of-virus-causing-covid-19-implications-for-ipc-precaution-recommendations?fbclid=IwAR2fSI9XRNHf9N8YcPBnNq2atn4T0K5NMTJGruItCpVR4mKgyo-HD_z7LV8

සැලකිය යුතුයි: ඉහත සඳහන් වන කරුණු පදනම් වී ඇත්තේ අදාළ පෝස්ටු පළ කෙරෙනා මොහොත වන විට ලබාගැනීමට තිබූ වඩාත්ම යාවත්කාලීන තොරතුරු මත බව කරුණාවෙන් සලකන්න. ස්තූතියි.

#MediaEthicsSL #lka #News #COVID19 #Coronavirus
#Aruna
— with WHO Sri Lanka.